# වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
# துறைமுகம் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
# Ministry of Ports and Civil Aviation

| මගේ අංකය<br>எனது இல<br>My Number | MPCA/MD/MS/027 | ඔබේ අංකය<br>உமது இல | | දිනය<br>திகதி<br>Date | 2026.01.30 |
|---|---|---|---|---|---|

මාධ්‍ය නිවේදනය

**<u>ගුවන් තොටුපළ සහ ගුවන්සේවා සමාගමේ හිටපු සභාපතිවරයා එම තනතුරින් ඉවත් කිරීම සම්බන්ධව මාධ්‍යවල පලවන සාවද්‍යය තොරතුරු නිවැරදි කිරීම.</u>**

ගුවන් තොටුපළ සහ ගුවන්සේවා සමාගමේ හිටපු සභාපතිවරයා වන හර්ෂ අබේවික්‍රම මහතා තනතුරින් ඉවත් කිරීමට හේතු වූ කාරණය ලෙස, ශ්‍රී ලංකා මහාබෝධි සංගමයේ සභාපති පූජ්‍ය බානගල උපතිස්ස හිමියන්, ගුවන් තොටුපළ පර්යන්තයට ඇතුලත්වීමට ලබාගත් විශේෂ අවසර පත්‍රයක් දීර්ඝ කිරීමට ඉල්ලීම් කරන ලද ලිපියක් පාදක කර ගනිමින් සාවද්‍ය මතයක් සමහර මාධ්‍ය තුල සංසරණය වෙමින් පවතී.

ශ්‍රී ලංකා මහාබෝධි සංගමයේ ලිපි ශීර්ෂය සහිත වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාට යොමු කරන ලද 2025.12.29 දිනැති පූජ්‍ය බානගල උපතිස්ස හිමියන්ගේ ලිපිය මඟින් උන්වහන්සේට පසු ගිය කාල වකවානුවල ලබා දී තිබූ ගුවන් තොටුපළ පර්යන්තයට ඇතුළුවීමේ විශේෂ අවසර පත්‍රය 2025.12.31 දින කල් ඉකුත්වන බැවින්, එය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා තිබේ.

අමාත්‍යතුමා පූජ්‍ය බානගල හිමියන්ගේ ජාත්‍යන්තර ශාසනික කටයුතු පිළිබඳ සලකා බලා, ගුවන් තොටුපළ පර්යන්තයට ඇතුළුවීමේ විශේෂ අවසර පත්‍රය 2025.12.31 දින සිට ඉදිරි වර්ෂයට දීර්ඝ කිරීමට කටයුතු කරන ලෙස එම ලිපියේම සටහනක් තබා ඉදිරි කටයුතු සඳහා හිටපු සභාපතිවරයාට යොමු කර තිබේ.

එහිදී විශේෂ අවසර පත්‍ර නිකුත්කිරීම සම්බන්ධයෙන් මීට පෙර අවස්ථාවල ඇති ඇතැම් අත්දැකීම් පිළිබඳව හිටපු සභාපතිවරයා සිදුකළ දැනුම්දීම් සලකා බලා සුදුසු කොන්දේසි සහිතව අවසර ලිපියක් නිකුත් කිරීමට අමාත්‍යතුමා උපදෙස් ලබා දී ඇත.

එම උපදෙස් වලට අනුකූලව 2026.01.09 දින පූජ්‍ය බානගල උපතිස්ස හිමියන්ට ලිපියක් යැවීමට හිටපු සභාපතිවරයා කටයුතු කර තිබේ.
(ඇමුණුම - 01)

ස්වාමීන්වහන්සේගේ ඉල්ලීමට අනුව අදාල ලිපිය නිකුත් කිරීම ජනවාරි මුල් සතිය තුල සිදු වූ අතර මේ කරුණ සම්බන්ධව අමාත්‍යතුමා සහ හිටපු සභාපති හර්ෂ අබේවික්‍රම මහතා අතර කිසිදු මත ගැටුමක් සිදු වී නොමැත.

ගුවන් තොටුපළ සහ ගුවන්සේවා සමාගමේ පරිපාලන ව්‍යුහයේ වෙනස්කම් කිහිපයක් හා තවත් කරුණු කිහිපයක අවශ්‍යතාවය මත සභාපති තනතුර පිළිබඳ තීරණයක් ගැනීමට සිදුව ඇති මොහොතක අමාත්‍යතුමා, හිටපු සභාපති හර්ෂ අබේවික්‍රම මහතා සමඟ 2026.01.21 වන දින කරන ලද සාකච්ඡාවකින් අනතුරුව ගුවන් තොටුපළ සහ ගුවන්සේවා සමාගමේ සභාපතිවරයා එම තනතුරෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

පූජ්‍ය බානගල උපතිස්ස හිමියන්ට යවන ලද ලිපිය හිටපු සභාපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමට කිසිදු ආකාරයකින් සම්බන්ධතාවක් නොමැති බව මෙලෙස කරුණු පැහැදිලි කරමි.

එබැවින් මෙම සත්‍ය තත්ත්වය ජනතාව වෙත සන්නිවේදනය කරන මෙන් සියළු මාධ්‍ය වලින් කාරුණිකව ඉල්ලා සිටිමි.

K.m.P.L. [signature]

පැට්‍රික් රොඩ්රිගෝ
අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්


වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව
துறைமுகம் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
எண். 19, சைத்யா சாலை, கொழும்பு 01, இலங்கை
Ministry of Ports & Civil Aviation
No. 19, Chaithya Road, Colombo 01, Sri Lanka

ලේකම් / செயலாளர் / Secretary: +94 (0) 11 2320252
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: secretary@portmin.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office: +94 (0) 112439352
ෆැක්ස් / தொலைநகல் / Fax No: +94 (0) 11 2435134